# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1640/7 - 2010 පෙබරවාරි 08 වැනි සඳුදා - 2010.02.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

**1990 අංක 04 දරන පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 3 වැනි වගන්තිය සහ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන ) පනතේ 2 වගන්තිය සමඟ කියවෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි**

1990 අංක 4 දරන දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 2 (2) වගන්තිය සහ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන ) පනතේ 2 වැනි වගන්තිය සමඟ කියවෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (2) වගන්තිය යටතේ දකුණු පළාතේ පළාත් සභාවේ මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන, ජල සම්පාදන හා ජලාපවහන, විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අංක 1639/4 හා 2010 පෙබරවාරි 01 වැනි දින අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සභාපති හේවා ලොකුගේ ජයසිරි මහතා එකී සභාවේ සභාපති ධුරයේ කටයුතු කිරීම වහාම අත්හිටුවා ඇති අතර, එකී සභාවේ සභාපති ධුරයේ බලතල ක්‍රියාත්මක කිරීමටත්, කාර්යය ඉටු කිරීමටත් 1990 අංක 4 දරන දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 3 (2) වගන්තිය යටතේ සහ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවෙන, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(3) (අ) (1) වගන්තිය අනුව තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ උප සභාපති සිරිසේන රත්නායක වීරකෝන් මහතාට විධාන කරනු ලැබීය.

02. එම ගැසට් නිවේදනය අනුව සිරිසේන රත්නායක වීරකෝන් මහතා 2010 පෙබරවාරි මස 03 වැනි දින දරන ලිපිය මඟින් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයේ බලතල ක්‍රියාත්මක කිරීම හෝ කාර්යය ඉටු කිරීම භාර නොගැනීම හේතුවෙන් 1990 අංක 04 දරන දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 3 (2) වැනි වගන්තිය යටතේ සහ 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විවිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමඟ කියවෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(3) (අ) (1) වගන්තිය අනුව තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයේ බලතල ක්‍රියාත්මක කිරීමටත්, කාර්යය ඉටු කිරීමටත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් බෝගහපිටිය සේරසිංහ ගමගේ රුවන්සිරි මහතාට විධාන කරනු ලැබේ.

ෂාන් විජයලාල් ද සිල්වා,
මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන,
ජල සම්පාදන හා ජලාපවහන, විදුලිබල ඉංජිනේරු
සේවා සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය හා පළාත් පාලන
විෂය භාර අමාත්‍ය, දකුණු පළාත.

2010 පෙබරවාරි මස 05 වැනි දින.

02-531

1A - PG 001115 — 780 (2010/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.